# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

ශ්‍රේණිය - 11

වාරය - තෙවන වාරය

නිපුණතා මට්ටම - 5.2 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ සාහිත්‍ය කලා පෝෂණය සඳහා දායක වූ පර්යේෂණාත්මක ලේඛන හෝ කෘති පිළිබඳ තොරතුරු විස්තර කරයි

ක්‍රියාකාරකම -

## පර්යේෂණාත්මක ලේඛන හෝ කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු

සැකසුම - ක්‍රිශාන්ති අලහකෝන්
මප/වත් /මැණික්හින්න ම. වි

මෙහෙයවීම - නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස්.. මෙය ලිඛිත පාඩමකි මෙය වැඩි
දුරටත් අධ්‍යයනය කිරීම සඳහා
පාසලේ ගුරු ඇසුර ලබා ගත යුතුය.

හැඳින් වීම ..

නූතන අධ්‍යාපනය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ වෙනස්කම් වලට භාජනය වෙමින් වර්තමාන තත්වයට පැමිණ ඇත. ඓතිහාසික කරුණු මෙන්ම නූතනයේ විවිධ ක්‍රමවේද භාවිතා කරමින් ඒ ඒ විෂයන් පිළිබඳ පර්යේෂණාත්මක කරුණු රැසක් එළි දක්වා ඇත.

එමෙන්ම නර්තන අධ්‍යාපනයද විකාශනය වීමේදී විවිධ පැතිකඩ ඔස්සේ විද්වතුන් කරුණු ඉදිරිපත් කරන්නට විය. එම කරුණු ඉදිරිපත් කිරීම බොහෝ විට ගවේෂණාත්මක තොරතුරු විශ්ලේෂණය තුළින් නිගමන වලට එළඹෙමින් සිදු කොට ඇත.
එම කරුණු මෑත කාලය තුළ එළි දක්වා ඇත්තේ ග්‍රන්ථ මගීනි එමඟින් මෙම විෂය හදාරන දරු දැරියන්ටත් වැඩි දුර අධ්‍යාපනයේ නියැලේන්නන්ටත් මහඟු පිටුවහලක් වී ඇත.

එම ලේඛකයන් ඔවුන් ගේ පර්යේෂණ කෘති, විෂය ක්ෂේත්‍රය සහ අන්තර්ගත කරුණු පිළිබඳ දැනුවත් වීම නර්තන දියුණුවට පිටු වහලක් වන බැවින් ඒ පිළිබඳ අධ්‍යයනනය ඉතා වැදගත් වේ.

- මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා
- මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා
- මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා
- ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය

යන අයගේ කෘති පිළිබඳ ඉහත ක්ෂේත්‍ර ඔස්සේ කරුණු විමසා බැලීම මෙම පාඩමෙහි අරමුණ වේ.

# නර්තන කලාවේ පෝෂණය සඳහා දායක වූ පර්යේෂණාත්මක ලේඛන

ශ්‍රී ලාංකේය නර්තන කලාව පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමින් විවිධ පර්යේෂණ ග්‍රන්ථ හා ලේඛන රැසක් විසිවන ශතවර්ෂයේ සිට අද දක්වා ලියවෙන්නට ඇත.

පර්යේෂණවල නිරතව ග්‍රන්ථකරණයේ යෙදුණු විද්වතුන් උඩරට,පහතරට,සබරගමු නර්තන සම්ප්‍රදාය වලට අදාළව ලියන ලද කෘතීන් රැසක් වේ. ඒ අතරින් සුවිශේෂ කෘති කිහිපයක තොරතුරු මෙහිදී ඉදිරිපත් කෙරේ.

# මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාගේ පර්යේෂණ කෘති

උඩරට නර්තන සම්ප්‍රදායය පිළිබඳ උපාධියක් ලබා ගත් මුදියන්සේ දිසානායක මහතා නර්තන විෂයයේ විද්වතුන් අතරින් මහාචාර්ය පදවියක් ලබා ගත් ප්‍රථම ලාංකිකයා වේ. මෙතුමා සම්පාදනය කර ඇති ග්‍රන්ථ අතරින් පහත සඳහන් ග්‍රන්ථ හඳුනා ගැනීමට යොමු කර තිබේ.








| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය මුදියන්සේ දිසානායක | කොහොඹායක් කංකාරිය හා සමාජය (1998) | උඩරට නර්තන සම්ප්‍රදාය | කොහොඹා කංකාරි ශාන්ති කර්මයට ආවේණික සියළු තොරතුරු |
| | සිංහල නර්තන කලාව (1993) | දේශීය නර්තන සම්ප්‍රදායයයෝ | නර්තන සම්ප්‍රදාය තුන පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු හා නර්තන විකාශනය පිළිබඳ තොරතුරු |

# මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතාගේ පර්යේෂණ කෘති

පහතරට නර්තන සම්ප්‍රදායය පිළිබඳ විශ්වවිද්‍යාල උපාධියක් ලබා ගත් රුහුණේ උපන් මෙතුමා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති වශයෙන් සේවය කර තිබේ. නර්තන විෂය හා සබැඳි ග්‍රන්ථකරණයට යොමු වී සිටිය මෙතුමාගේ ග්‍රන්ථ අතරින් කීපයක තොරතුරු පහත සඳහන් වේ.





| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ | පහතරට ශාන්ති කර්ම සාහිත්‍යය (1995) | පහතරට නර්තන සම්ප්‍රදාය | පහතරට ශාන්තිකර්මවල දක්නට ලැබෙන රංග ශෛලින් පැහැදිලිව හා විස්තරාත්මක ව දැක්වීම රිද්දි යාගය සූනියම් ශාන්තිය, මහසොහොන් සමයම,සන්නි යකුම මේවායේ නාට්‍යමය ලක්ෂණ සමයන් පෙළපාලි හා සන්නිවේදන |

| | | | |
|---|---|---|---|
| | භාරතීය සම්භාව්‍ය නර්තන කලාව (2001) | දේශීය නර්තන සම්ප්‍රදායයෝ | භරත නාට්‍ය,කථක්,කථකලි හා මණිපුරී නර්තනය පිළිබඳ තොරතුරු රසභාව හා අභිනය පිළිබඳ තොරතුරු |

# මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ පර්යේෂණ කෘති

සිංහල විෂයානුබද්ධ ව මහාචාර්ය ධූරයක් දැරූ තිස්ස කාරියවසම් මහතා නර්තනය හා සබැඳි පරයේෂණ කෘති කිහිපයක් සම්පාදනය කර ඇත. මේ අතරින් පහත සඳහන් කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම වැදගත් වේ.



| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය තිස්ස කාරියවසම් | ශාන්ති කර්ම සහ සිංහල සමාජය (1998) දෙවන මුද්‍රණය | නර්තනය හා බැඳි ශාන්තිකර්ම | යක් තොවිල්, පත්තිනි දේවිය හා යකුන් පිළිබඳ තොරතුරු විවිධ උපත් කතා ශාන්තිකර්මවල සමාජ සම්බන්ධය |
| | රට යකුම හෙවත් රිද්ද යාගය (1995) | පහතරට නර්තන සම්ප්‍රදාය | රටයකුම යාගයේ පූජාවිධි රටාව රටයකුමේ එන කවි නාට්‍යමය ලක්ෂණ |

# ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මියගේ පර්යේෂණ කෘති

සබරගමුව නර්තන සම්ප්‍රදායය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය ඒ පිළිබඳ පර්යේෂණ ග්‍රන්ථ සම්පාදනය කර ආචාර්ය උපාධික් ලබාගත් ප්‍රථම ලාංකික කාන්තාව ලෙස නම් කළ හැකිය.ඒ අතරින් පහත සඳහන් ග්‍රන්ථ පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වේ.





| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය | සබරගමු නර්තන කලාව (2000) | සබරගමු නර්තන සම්ප්‍රදාය ය | සබරගමු නැටුම් පිළිබඳ තොරතුරු දේව ශාන්ති, යක් තොවිල්,ග්‍රහ පන්ති,සබරගමු වන්නම්,එහි නිශ්චිත නාදමාලා සහිතව ප්‍රස්තාර ගත කොට දැක්වීම ශාස්ත්‍රීය නර්තන නාට්‍යමය පෙළපාලි මාත්‍රා සහ ප්‍රස්තාර කර දැක්වීම ආදී තොරතුරු |

| | | | |
|---|---|---|---|
| | සමන් දේවාල පුද සිරිත් (2008) | සබරගමු නර්තන සම්ප්‍රදායය | සමන් දේවාලයේ පෞරාණික චාරිත්‍ර පෙරහැර මංගල්‍යය පිළිබඳ තොරතුරු සහ සමන් දෙවියන් පිළිබඳ මතවාද නිවැරදි කොට සාධක සහිතව ඉදිරිපත් කිරීම් |